# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2134/48 – 2019 අගෝස්තු 01 වැනි බ්‍රහස්පතින්දා – 2019.08.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දඩැල්ල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක ජීඒ/ජීඑෆ්ජී/2016/313 හා 2016.09.14 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කොටස්වලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ'– කනත්ත නොහොත් කනත්ත වත්ත සහ දෙනිය කනත්ත – ප්‍රමාණය: හෙක්. 0.2962ක් පමණ**

උතුරට: ලංකා ගමනාගමන මණ්ඩලය ගිංතොට ඩිපෝව හිමිකම් කියන ජනරාල්ගෙවත්ත; නැගෙනහිරට: කැබලි අක්ෂර බී සහ ඇටඹගහවත්ත; දකුණට: කැබලි අක්ෂර බී; බටහිරට: කැබලි අක්ෂර බී සහ ලංකා ගමනාගමන මණ්ඩලය ගිංතොට ඩිපෝව හිමිකම් කියන ජනරාල්ගෙවත්ත.

02. **කැබලි අක්ෂර 'බී'– කනත්ත නොහොත් කනත්ත වත්ත සහ දෙනිය කනත්ත – ප්‍රමාණය: හෙක්. 1.0714ක් පමණ**

උතුරට: ලංකා ගමනාගමන මණ්ඩලය ගිංතොට ඩිපෝව හිමිකම් කියන ජනරාල්ගෙවත්ත, ශිරානි මහවිතාන සහ තවත් අය හිමිකම් කියන හැටදෙකේ වත්ත, මාර්ගය සහ ඩබ්ලිව්. ෂෙල්ටන් හිමිකම් කියන ඇටඹගහවත්ත; නැගෙනහිරට: මහවිතාන ශිරානි සහ තවත් අය හිමිකම් කියන හැටදෙකේ වත්ත, මාර්ගය, ඩබ්ලිව්. ෂෙල්ටන් සහ තවත් අය හිමිකම් කියන ඇටඹගහවත්ත, කැබලි අක්ෂර සී සහ මාර්ගය; දකුණට: කැබලි අක්ෂර සී, මාර්ගය සහ තවත් අය, කැබලි අක්ෂර ඩී; බටහිරට: කැබලි අක්ෂර ඩී සහ ලංකා ගමනාගමන මණ්ඩලය ගිංතොට ඩිපෝව හිමිකම් කියන ජනරාල්ගෙවත්ත.

03. **කැබලි අක්ෂර 'ඩී'– කනත්ත නොහොත් කනත්ත වත්ත සහ දෙනිය කනත්ත – ප්‍රමාණය: හෙක්. 0.4030ක් පමණ**

උතුරට: කස්තුරි ඉන්ද්‍රානි සහ තවත් අය හිමිකම් කියන මහගෙදර වත්ත, ලංකා ගමනාගමන මණ්ඩලය ගිංතොට ඩිපෝව හිමිකම් කියන ජනරාල්ගෙවත්ත, කැබලි අක්ෂර ඒ සහ බී; නැගෙනහිරට: කැබලි අක්ෂර ඒ සහ බී; දකුණට: මාර්ගය සහ කස්තුරි ඉන්ද්‍රානි සහ තවත් අය හිමිකම් කියන මහගෙදර වත්ත; බටහිරට: කස්තුරි ඉන්ද්‍රානි සහ තවත් අය හිමිකම් කියන මහගෙදර වත්ත.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/9/2015/ඩබ්ලිව්එස්/209.
2019 මාර්තු මස 28 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

08 -599